


පහුගිය මාසය කලාවට වෙනවුණු මාසයක් වගේ වුණා. සංගීත ප්‍රසංග, චිත්‍රපට , නැටුම් දර්ශන මෙල්බන් පුරාම දැක ගන්න ලැබුණා. සෞන්දර්යත් සමඟ ජීවත් වෙන්න ලැබෙන ටික කාලය වුණත් මොනතරම් වටිනවද? ඒත් එකම කාලයක් තුළ නොකඩවාම සංදර්ශන ආවම ඒක අපිට කරන ලොකු අසාධාරණයක්. පවුලක් වශයෙන් මේවට සහභාගී වෙන්නේ කොහොමද? ඒක ටිකක් දරා ගන්න අමාරුයි මෙහේ තිබෙන ජීවන රටාව අනුව. කෙසේ හෝ අපි ප්‍රසංග කීපයක් නරඹන්න ගියා.

අපේ පුද්ගලිකව කුමන දේශපාලන මතයක් දැරුවත් මේ ලිපි තුළින් දේශපාලනික අදහස් කතා නොකරන්න තීරණය කරල තිබුණේ. ඒත් අපි කොහොමද ඒකෙන් මිදෙන්නේ? අප අවට ඇති දෙයක්ම දේශපාලනීකරණය වෙලා ඇති විටෙක.. පසු කාලය පුරාම එක දිගටම අපේ මව් බිම තුළ සිදු වුණු සිදුවීම් දිහා බැලුවම අපිට තේරුම් යන්නෙ මොනවද? අපේ හැඟීම්, අපට සිතෙන දේ අප කොපමණ උත්සාහ දැරුවත් යටපත් කර ගෙන ඉන්න පුළුවන්ද? මේවා දිහා කොපමණ උපේක්ෂාවකින් බලන්න උත්සාහ දැරුවත් අපට පාලනය කර ගන්න බැරි විදිහට අපේ බුද්ධියට වඩා හදවත එළියට ඇවිත් අපට උපදෙස් දෙන්න හදනවා. මේවට පිළිතුරු දිය යුත්තේ වන් ෂොට්ගේ ක්‍රමයට කියන තැනට අප නිරායාසයෙන්ම යනවා. ඒක හරි පොදු තත්ත්වයක්. කොහේ ගියත් පොදු අදහස වෙන්නේ ත්‍රස්තවාදය මුලිනුපුටා දැමිය යුතුය යන්නයි. ඒක කරන්නෙ කොහොමද? ඒක තමයි දැවෙන ප්‍රශ්නය. තිරයෙ දකින යුද්ධය, ප්‍රායෝගික යුද්ධය කියන්නෙ දෙකක්. මේවා ගැන අපි හැඟීමෙන් කතා කරන කොට අපේ රටේ කලාකරුවෙක් හරි සියුම් විදිහට යුද්ධයෙන් බැට කන මිනිසුන් ගැන අපූරු චිත්‍රපටියක් කරලා තිබුණා. කෙතරම් අපහසුකම් මැද්දේ වුණත් හොඳ දේ කල යුතු නිසා අපි ප්‍රසන්නගෙ -ඉර මැදියම" බලන්න ගියා. ලංකාවෙදි නම් අපේ ජනතාව එතරම්ම හොඳ ප්‍රතිචාරයක් දක්වල තිබුණේ නැතිලු මේකට. අපට හුරුපුරුදු කතා කියන සම්ප්‍රදායෙන් මිදුණු ක්‍රමයක් එහි තිබුණේ. හරිම අපූරුයි. ප්‍රශ්නෙ තියෙන්නෙ මිනිස්සු මොන විදිහට මේක තේරුම් ගත්තද කියන එකයි. මෙහේ ශාලාවේ නම් සෙනඟ හිටියා. චිත්‍රපටය අවසානයේදීත් බොහෝ දෙනෙකුට කථාව අවසන් කියලවත් තේරුම් නොගිය බවයි මට නම් හැඟුණේ. මා සමඟ කතා කරපු කීප දෙනෙක්ම අදහස් දැක්වූයේ ඒ තරම් ප්‍රසාදයකින් නෙමෙයි.

මොනවා වුණත් ප්‍රසන්න කියලා තිබුණෙ ඇත්ත. යුද්ධය නිසා අපේ සමාජය වෙනස් වෙලා. ගමේ, නගරේ ශුද්ධ භූමියෙ කියලා වෙනසක් නැහැ. හෙඳයි. ඇත්තටම අපි යුද්ධෙ ගැන චිත්‍රපට හදන්න ඕන කොහොමද? කොටි කඳවුරකට බැහැල, හතර වටේට ගහලා, හිරකාරයෝ බේරගෙන එන වීර කවි ගැන, හමුදා සෙබළා යාපනේ ද්‍රවිඩ තරුණියකට කරන ආදරේ ජය ගන්නා හැටි..හිත උණු වෙන කොටි සෙබළියගේ උදව්වෙන් පැන එන සෙබළු ගැනද? මේවා තමයි යුද්ධෙ කියලා අපි දැකලා තියෙන, අපිට දකින්න සලස්වල තියෙන දේ. ඒකත් දේශපාලනයේම එක පැතිකඩක් තමයි.



ඕනෙම කලාවක් හඳුනා ගැනීම හා එය රස විඳින්නේ කෙසේද යන්න ගැන අවබෝධයක් ලබා ගැනීම හරි වැදගත්. මේ කාලයේ බොහොම ජනප්‍රිය මතයක් තමයි, මිනිස්සු චිත්‍රපට බලන්නේ විනෝද වෙන්න මිසක් ප්‍රහේළිකා විසඳන්න නෙමෙයි කියන එක. ඒක හරි බොළඳ අදහසක්. තමන් කරන නිර්මාණ තුළින් පවතින සමාජ යථාර්තය හෙළිදරව් කරල ඒ ගැන අවබෝධයක් ලබා දීලා ජනතාව දැනුවත් කරන එක තමයි කලාවෙන් විය යුත්තේ. නැතුව සිහිනෙන්වත් සිදු විය නොහැකි මනෝ ලෝක මවලා පෙන්වලා මිනිස්සුන්ව රස විඳීම අතින් හිටපු තැනිනුත් පහළට දමන එක නෙමෙයි කළ යුත්තේ. පහුගිය සතියක දැකපු සසල රූ ප්‍රසංගයේදීත් චිත්‍රපට ප්‍රහේළිකා ගැන දැඩි උපහාසයක් ගාමිණී ෆොන්සේකා මහත්තයත්, මෙලනි සහෝදරියත් එල්ල කලා මතකයි. මාධ්‍යය හසුරවන අයත් කලාකරුවන්ගේ උසස් රස වින්දනයන් ගොඩ නගන්න ගන්න උත්සාහය ගැන තක්සේරු කරන්නේ ඒ විදිහට නම් සාමාන්‍ය රසිකයට හැමදාම කුච් කුච් හෝතා හේ තමයි.

මේ සේරම අතරේ අපි පසුගියදා රාත්‍රී භෝජන සංග්‍රහයකදී සිදු වූ දෙයක් මා ඔබට කියන්නම්. සෑම සාදයකදීම මත්පැන් අත්‍යවශ්‍ය අංගයන් නේ. එතන තමයි විවෘත වේදිකාව වෙන්නේ. ගැහැණු අපිට තියෙන්නේ අහන් ඉන්න. මේ දිනවල පොදු මාතෘකාව කදිරගාමර් සහ කොටි. බොනවා, කතා කරනවා, තර්ක කරනවා, විසඳුම් හොයනවා, උපදෙස් දෙනවා. ඒක එදා රෑට විතරයි. පහුවෙනදාට ඒක එදා රෑ බීමට ගත් බයිට් එකක් විතරයි. හැබැයි එහෙම නොවෙන අවස්ථාවලුත් තියෙනවා..

**මේ කාලයේ බොහොම ජනප්‍රිය මතයක් තමයි, මිනිස්සු චිත්‍රපට බලන්නේ විනෝද වෙන්න මිසක් ප්‍රහේළිකා විසඳන්න නෙමෙයි කියන එක. ඒක හරි බොළඳ අදහසක්.**

ඇත්තටම මේ මෙල්බන් වල සාද වලදී මිනිස්සු දක්වන අදහස් වල හැටියට ඒ වෙලාවල් වලදී පෙන්වන දේශප්‍රේමයේ හැටියට පහුවෙනිදත් වැඩ කරනවා නම් මොන තරම් හොඳද? එහෙම නම් අපට අඩු වශයෙන් පොදු විරෝධයකදී එක දහපහළොස් දාහක් එකතු කර ගන්න පුළුවන් ඒත් අපිට පොදු විරෝදෙකට එක දහක්වත් සොයා ගන්න බැරි ඇයි? ඒ අර දේශප්‍රේමය අප බීමෙදි බයිට් එකට විතරක් ගන්න නිසා මට හිතෙන්නේ. අඩ සිහියෙන් මොන දේ කතා කළත් පියෙවි සිහියේදී රටට වඩා තමන්ට කළ යුතු දේ කොපමණ තියෙනවද?

ඉතිං අප ගිය සාදයේදීත් ඔය පොදු මාතෘකාව ගැන උණුසුම් කතා බහක් සිදු වුණා. උද්වේගකර අවස්ථා, තර්ක විසඳුම් එහි නොඅඩුව තිබුණා. හැබැයි සමහරු එහිදී තර්ක කලා අපි දේශපානයෙන් මිදී මෙහිදී කටයුතු කළ යුතුයි කියලා. එයට විරුද්ධව කීප දෙනෙක් එක හඬින් අදහස් දැක්වුවා. ඔවුන්ගේ තර්කය වුණේ මිනිසා දේශපාලන සත්ත්වයෙකු බවයි. ඉන් මිදීමට ඔහුට නොහැකි වෙයි. ඔවුන් හොඳ අදහස් ඉදිරිපත් කලා. ඔවුන්ගේ හැර තර්කයන් ඉදිරියේ ප්‍රතිවිරුද්ධ මතවාදී මෙල්ල වී ගිය බවක් පෙණුනේ. වෙනකම් ඇදී ගිය පසුව ගෙහිමියන්ගේ බලවත් පෙරැත්තය මැද්දේ කතාව අවසන් කර සියළු දෙනාම කෑමට සූානම් වුණා. අපට කෑමට යන්න තිබුණේ සිටි තැන ඉඳන් එහායින් තිබුණ සාලය වෙත. අපි ගැහැණු සියළු දෙනා ඒ වෙන කොට කෑම අවසන් කොට තිබුණේ. ඔවුන් කෑම මේසය වෙත යන අතරමගදී අර ශූර ලෙස "මිනිසා දේශපාලන සත්ත්වයෙකු" කියා තර්ක කල එක මහත්මයෙකු අසළ වාඩි වී සිටි තරුණියකගෙ සායෙන් මදක් නිරාවරණය වූ දෙපා දෙස හෙළු බැල්ම මා තුළ දැඩි කම්පනයක් ඇති කළා. ඒ සමඟම මට තේරුම් ගියේ ඔහු මද වෙලාවකට පෙර තර්ක කල දේ සත්‍ය බවයි. ඒ මිනිසා තුළ දේශපාලන කෙසේ වෙතත් සත්ත්වයෙකු ජීවත් වන බවයි.

සොයුරිය ධරණී

# මානෙල් ජයසේන සුව සේවා හා අධ්‍යාපනික සේවා අරමුදල



ඇය සිංහල නාට්‍ය ඉතිහාසයේ (සමහර විට ලෝකයේම) එකම චරිතය වැඩිම කාලයක් රඟ දැක්වූ නිළිය වූවා ය. සිංහල නාට්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙකුගේ බිරිඳ වෙමින් ඔහුගේ ගමන් මඟ පුරා සෙවනැල්ලක් සේ නොසැළී සිටියාය. මානෙල් ජයසේන නම් වූ මේ අග්‍රගන්‍ය රංග ශිල්පිණිය ගිය වසරේ ජූලි 24 වන දා අප හැර ගියේ අප සිත් තුළ මහා හිඩැසක් ඇති කරවමිනි.

ජීවත්ව සිටි මුළු කාලය පුරාම තම දිවිය සිංහල නාට්‍යය වෙනුවෙන් කැප කළ මේ අසහාය කලාකාරිය වෙනුවෙන් ඇගේ නමින් සමාජ මෙහෙවරක් කරන්නට "මානෙල් ජයසේන සුව සේවා හා අධ්‍යාපනික සේවා අරමුදල" නමින් අරමුදලක් පිහිටුවා ඇත.

අසරණ රෝගීන්ට පිහිට වීමත් අඟ හිඟ කම් වලින් පෙළෙන දිළිඳු දරුවනගේ අධ්‍යාපනය සඳහා අත්වැලක් සැපයීමත් අරමුදලේ අරමුණු අතර වෙයි. පදනමේ භාරකරුවන් වශයෙන් හෙන්රි ජයසේන, සුදාරක ජයසේන, දොස්තර චූලා හේරත්, මහින්ද ගල්ගමුව, නිමල් ජයසිංහ, කේෂිණී බණ්ඩාරනායක, ජයධාරි ගුණවර්ධන යන මහත්ම මහත්මීන් කටයුතු කරති.

මානෙල් ජයසේන මහත්මිය වසර ගණනාවක් අප කුල්මත් කළා ය. හුණුවටයේ ගෘෂා ලෙසින් අප සිත් තුළ නොමැකෙන චරිතයක් බිහි කළා ය. ඇගේ රැඟුමින් වින්දනය ලද සුවහසක් ප්‍රේක්ෂකයනට දැන් ඈ වෙනුවෙන් පෙරළා යමක් කරන්නට අවසරයක් ලැබී තිබෙයි. දැන් ඔබේ වාරයයි. මානෙල් ජයසේන සුව සේවා හා අධ්‍යාපනික සේවා අරමුදලට ඔබේ නොමසුරු ආධාරය ලබා දෙන්න.

නුගේගොඩ මහජන බැංකුවේ Manel Jayasena Health care and Educational Trust Fund නමින් පිහිටුවා ඇති අංක 2650758677 දරණ ඉතිරිකිරීමේ ගිණුමට හෝ එහිම අංක 1650107693 දරණ ජංගම ගිණුමට ඔබේ පරිත්‍යාගය යොමු කරන්න.

වැඩි විස්තර සඳහා www.maneljayasena.org වෙබ් අඩවියට පිවිසෙන්න.

